## 4.1.1 නිර්දිෂ්ඨ ජනකවි වල පසුබිම් විස්තර කරමු.

(රබන්, චාමර, ඔන්චිලි වාරම් ගාථා)

- ජනකවියක දක්නට ලැබෙන සුවිශේෂී ලක්ෂන 3ක් නම් කරන්න.
- රබානට එකැස් බෙරය යන නම භාවිතා කරන හේතුව සඟදන් කරන්න.
- සන්නිවේදනය සඳහා රබාන භායොදා ගනු ලබන අවස්ථාවක් නම් කරන්න.
- මේ අතුරින් රාජ සභාව ඇසුරින් නිර්මාණය වූ ගායනා විශේෂය නම් කරන්න.
- මේ අතුරින් ප්‍රශස්ති ගායනා යොදා ගත හැකි නර්තනය නම් කරන්න.
- දරා ගැනීමේ හැකියාව අභියෝග වලට මුහුණ දීමේ හැකියාව වර්ධනය වන ජන ක්‍රීඩාව නම් කරන්න.
- දෙන ලද ගායනා කට පාඩම් කරන්න.

### ඇමුණුම
### ඔංචිලි වාරම් කවි

1. පුරවර මැද බැදි රන් ඔන්චිල්ලා දුර යන තරමට පුදුම නොවෙල්ලා
   වැර සැර පිරිමින් තව පැදපල්ලා සුරපුර දෙවියන් රැකුමෙ සියල්ලා

2. අට දෙන අට කොන වාඩි වෙයල්ලා සිටගෙන දෙදෙනෙක් පොලු පාගල්ලා
   වච්ලන් ලෙස කැරකෙන ඔන්චිල්ලා අපිත් පදිමු මේ රන් ඔන්චිල්ලා

### චාමර කවි

සොබමන් දෙව්වරු සදෙනෙක් එතනට
බසිමින් චාමර ගත්තේ සුරතට
ගනිමින් චාමර සැලුවේ මුනිඳුට
අපි දූන් දක්වමු ඒ රඟ සබයට

චාමර නර්ථනය සඳහා ඉහත කවිය භාවිතා කරන අතර චාමර නර්තනය රාජ සභා ලක්ෂණ ගන්නා නිසා වර්තමානයේ දී ප්‍රශස්ති කවිද භාවිතා කරයි.

උදා :- ජය ජය සිංහ නරේන්ද්‍රා රක්ෂ රක්ෂ - ජය ජය සිංහ සුරේන්ද්‍රා
ජය ජය සිංහ සුරේන්ද්‍රා රක්ෂ රක්ෂ - ජය ජය කන්ද සුරින්ද්‍රා
පාදපත්ම අසුරන් ඔද බින්දා - සිරිහස් දරු වේලා අච්යෙන්ද්‍රා
ගත්තද නෙත් දොල සින්දා රක්ෂ රක්ෂ - දෙව් රැකදෙන් සුර නන්දා

සැකසුම : එම්.ඩබ්.ඩී.එස්.එම්.කාන්තිමාලා
නැටුම්(ගුරු උපදේශක)